# 3 යහපත් බැටළු එඬේරා

**දෙවියන් වහන්සේ අපගේ යහපත් එඬේරාණන් බව අවබෝධ කර ගනිමින් උන්වහන්සේ තුළ තිබූ එඬේර චරිත ලක්ෂණ අපගේ ජීවිතවලට අදාළ කර ගත හැක්කේ කෙසේ දැයි විමසා බැලීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

**එසකියෙල් 34: 11-19, ගීතාවලිය 23, ශු. ජොහාන් 10: 7-16**

### එඬේරුන් සම්බන්ධව බයිබලයෙන් හෙළි වන කාරණා

ඉශ්රායෙල් ජනතාව අතර එඬේර වෘත්තිය බොහෝ අයට පොදු එකක් විය. සමහරුන් බැටළු පට්ටි හිමිකරුවන් වූ අතර, බොහෝ අය ඔවුන් යටතේ වැඩ කළහ. සුළු පරිමාණයේ බැටළු රැළවල් අයිති එඬේරු ද මේ අතර සිටියහ. ආබෙල්, ජාකොබ් හා ඔහුගේ දරුවන්, දාවිත් වැනි අය එඬේර ජීවිත ගත කළ අය වූහ.

ඉශ්රායෙල්වරු දෙවියන් වහන්සේ තම එඬේරාණන් ලෙස සැලකූහ. (උත්පත්ති 48: 15) ක්‍රි. පූ. 10 වන ශත වර්ෂයේ පමණ ලියනු ලැබූ ගීතාවලිය පුස්තකයේ මේ අදහස වඩාත් අර්ථවත් ලෙස ඉදිරිපත් කර තිබේ. (ගීතාවලිය 23.) ඔවුහු එසේ ම දෙවියන් වහන්සේ සිය සෙනග තුළින් බලාපොරොත්තු වන නායකත්ව භූමිකාව එඬේර රූපකය ඇසුරෙන් සිතූහ. (එසකියෙල් 34: 11-16).

නව ගිවිසුම තුළ ජේසුස් වහන්සේ යහපත් බැටළු එඬේරාණන් ලෙස ඉගැන්වේ. (ජොහාන් 10: 7-9). මේ සියලු සඳහන් කිරීම් හා ඉගැන්වීම් තුළ දෙවියන් වහන්සේ අපට දක්වන ප්‍රේමයත්, ඒ නිසා ම අපට සලසන පෝෂණය හා ආරක්ෂාවත් අන්තර්ගත වී තිබේ. එසේ ම දෙවියන් වහන්සේ ඒ වගකීම් සිය සෙනග තුළින් නායකයන් හැටියට බලාපොරොත්තු වන බව ද පැහැදිලි ය.

### එඬේර චරිත ගුණාංග

මෙම පාඩමට අදාළ ශුද්ධ ලියවිලි පාඨ ඇසුරෙන් අපි එඬේර චරිත ගුණාංග පිළිබඳව අවබෝධ කර ගනිමු. මේ චරිත ගුණාංග එඬේර කාර්යභාරය හා බැඳී පවතී.

#### (අ) පෝෂණය

බැටළුවන්ට අවශ්‍ය ආහාර හා ජලය සැපයීම එඬේරාගේ මූලික කාර්යයකි. එඬේරාණෝ, බැටළුවන් "සුනිල් තණ බිම් මත සතප්වා" (ගීතා 23: 2) ඔවුන් "හොඳ තෘණවලින්" (එසකියෙල් 34: 14) පෝෂණය කරන්නාහ.

#### (ආ) මග පෙන්වීම රැක බලා ගැනීම හා සොයා ගෙන ඒම.

එඬේරා නිතර ම බැටළුවන් සමග ම සිටියි (ගීතා 23: 4). මේ භූමිකාව පිළිබඳව එසකියෙල් 34: 16 පදය මතක තබා ගැනීම ඉතා වැදගත් ය. "මම නැති වූ බැටළුවා සොයන්නෙමි. මුළාව ගිය බැටළුවා ආපසු ගෙනෙන්නෙමි.

තුවාල වූ බැටළුවාගේ තුවාල බඳින්නෙමි. ලෙඩ වූ බැටළුවන් රැකබලා ගන්නෙමි". සිය දණ්ඩෙන් හා සැරයටියෙන් (ගීතාවලිය 23: 4) මග පෙන්වන එඬේරා ගැන ගීතාවලියේ 23:4 කථා කරයි. ඔහු නැති වූවන් සොයා තුවාල වූ දුබල වූ බැටළුවන් රැකබලා ගැනීමේ වගකීම් ඉටු කරන එඬේරත්වය ගැන අවධාරණය කරයි.

## ඇ) ආරක්ෂා කිරීම හා ජීවිතය කැප කිරීම.

මේ කාර්යය ද එඬේරකුගේ කාර්යභාරයේ වැදගත් එකකි. දාවිත් රජතුමා 'මරණය වැනි ගණ'දුරු රුදුරු නිම්නය මැදින් ගියත්' (ගීතාවලිය 23: 4) යනුවෙන් සඳහන් කරයි. දිව්‍ය එඬේරාණෝ සිය බැටළුවන් සමග සිට ඔවුන් ආරක්ෂා කරන්නාහ. එසේ ම 'සතුරන් ඉදිරියේ දී මංගල බොජුනක් පිළියෙළ කර දීම' යනුවෙන් අදහස් වන්නේ බැටළුවන්හට (ජනතාව) දේව ආරක්ෂාව මුළුමනින් ලැබෙන හෙයින් නිදහසේ බිය සැක නැතිව කල් ගෙවිය හැකි බව යි. මින් මතුවන වැදගත් ම කාරණය නම් බැටළුවන් වෙනුවෙන් එඬේරා සිය ජීවිතය පරදුවට තබා කටයුතු කරමින් සිය ජීවිතය පවා ඔවුන් වෙනුවෙන් පූජා කිරීම යි. (ජොහාන් 10:11)

## (ඈ) හඳුනා ගැනීම.

එඬේරකුගේ ඊ ළඟ ගුණාංගය නම් බැටළුවන් වෙත දක්වන සංවේදී බවත්, ඔවුන් ගැන ඇති ගැඹුරු අවබෝධයත් ය. මේ සම්බන්ධයෙන් ජොහාන් තුමා, ජේසුස් වහන්සේ සිය පියාණන් ඉතා ගැඹුරු ලෙස හඳුනන්නාක් මෙන් එඬේරාණන් ද සිය බැටළුවන් හඳුනන බව පවසයි. බැටළුවෝ ද එඬේරාගේ කටහඬ අඳුනති. (ජොහාන් 10: 4, 14-15) මෙයින් එඬේරාණන් හා බැටළුවන් අතර පවතින ගැඹුරු අභ්‍යන්තරික සම්බන්ධතාව පැහැදිලි වෙයි.



ඉහතින් අප ඉගෙන ගත් පරිදි එඬේරත්වය තුළ

(I) අප එඬේරුන් ලෙස කටයුතු කළ යුතු අයුරු

හා

(ii) බැටළුවන් ලෙස ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව අපගේ සිත් යොමු කරමු.

## එඬේරුන් ලෙස අප ක්‍රියා කළ යුතු අයුරු.

### (අ) එඬේර ප්‍රේමය:

එඬේරකු බැටළුවන් ගැන ක්‍රියා කරන්නේ ප්‍රේමය පෙරදැරිව ය. බැටළුවන් පෝෂණය කරන්නේත් ඔවුන්ට ආරක්ෂාව සලසන්නේත් ඔවුන් සොයා යන්නේත් එසේම ඔවුන්ගේ තුවාල බඳින්නේත් ප්‍රේමය නිසා ය. අපත් නායකයන් ලෙස ක්‍රියාකරන විට අධිකාරිත්වයක් ප්‍රකාශ කිරීමට වඩා අපේ භාරයට දී සිටින අය ගැන ක්‍රියා කළ යුතු වන්නේ ප්‍රේමය පෙරදැරිව ය.

### (ආ) කැපවීම:

ප්‍රේමය කැපවීමෙන් ප්‍රකාශ වෙයි. ඉන් සම්පූර්ණ වෙයි. ජේසුස් වහන්සේ සිය දිවිය යාගික ලෙස පූජා කරන තරමට කැප වූ සේක. (ජොහාන් 10: 15). අපත් අපගේ ආත්මාර්ථකාමී පිළිවෙත් පසෙක ලා සමාජයේ සිටින අය වෙනුවෙන් කැපවීමෙන් යුක්තව සේවය කළ යුතු ය.

### (ඇ) සේවකත්වය:

අපේ යහපත් එඬේරාණන් වන්නේ දෙවියන් වහන්සේ ම ය. ඒ නිසා දෙවියන් වහන්සේ තුළ ඇදහිල්ලෙන්, උන්වහන්සේ හා බැඳී පැවතෙමින් සමාජයට සේවය කිරීම වැදගත් ය. ජොහාන් 10: 16 පදය මෙලෙස සඳහන් කරයි. "තව ද මේ රැළට අයිති නොවූ අන් බැටළුවෝ ද මට ඇත්තාහ." මේ අනුව එඬේරාගේ රැළ යනු අප පමණක් ම නොවන අතර, අපට පරිබාහිරව සිටින අන්‍ය බැටළුවන් (අන් අය) වෙත ද අපගේ සේවය විහිදුවාලිය යුතු ය.

## බැටළුවන් ලෙස අප ක්‍රියා කළ යුතු අයුරු.

### (අ) එඬේරාගේ හඬට ප්‍රතිචාර දැක්වීම.

යහපත් එඬේරා වන ජේසුස් වහන්සේගේ හඬ හඳුනාගෙන උන් වහන්සේ පසුපස යන්නට තීරණය කිරීම මගින් වංක එඬේරුන් පසුපස යෑම වැළකෙයි. (ජොහාන් 10: 4-5)

### (ආ) එඬේරාගේ හඬට පිටුපෑමෙන් සිදුවන අන්තරාය

"දොරටුව මම ය, මා තුළින් යමෙක් ඇතුළු වන්නේ ද, ඔහු ගලවනු ලැබ, ඇතුළට හා පිටතට ගොස් ආහාර ලබන්නේ ය" (ජොහාන් 10: 8).

ජේසුස් වහන්සේගේ කැමැත්තට අනුකූල වීමෙන්, බැටළුවන් වන අප අන්තරාදායක තත්ත්වවලින් මිදේ. එහෙත් දේව කැමැත්තට යටත් නොවීමෙන් අපගේ ජීවිතය බොහෝ විට විනාශය හා අන්තරාදායක තත්ත්ව කරා ගමන් කරනු ඇත.

### (ඇ) විශ්වාසවන්ත බැටළු එඬේරාණන් හට කීකරු වීම

"මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිස ය, සපුරා ම එය ලැබෙන පිණිස ය" (ජොහාන් 10: 10)

බැටළු එඬේරාණන්ට කීකරු වීම හා විශ්වාසවන්ත ව සිටීම තුළ බැටළුවන් වන අප හට පූර්ණ ජීවනය අත්දැකීමේ අවස්ථාව හිමි වෙයි.

අයහපත් එඬේරුන් බොහෝ දෙනෙකු අප වටා සිටිය හැකි ය. එවැනි අය ක්‍රියා කරන ආකාරය තේරුම් ගනිමින්, යහපත් එඬේරාණන් කෙරෙහි පමණක් විශ්වාසවන්ත ව සිටීම වැදගත් ය.

මක් නිසා ද අයහපත් එඬේරුන්ගේ අරමුණ විනාශකාරී ය. (ජොහාන් 10: 10)

"සොරා එන්නේ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශ කරන්ටත් පමණකි".
(ජොහාන් 10: 12).

"එඬේරකු නො වන, එසේ ම බැටළුවන්ගේ අයිතිකාරයා ද නොවන කුලීකාරයා වෘකයා එනු දැක බැටළුවන් හැර දමා පළා යන්නේ ය"

ඉහත සියලු කරුණු දැන ගැනීම තුළින් ජේසුස් වහන්සේ අපගේ එක ම යහපත් එඬේරාණන් බව පැහැදිලි වේ. තව ද අපි උන්වහන්සේගේ රැළෙහි බැටළුවන් ලෙස උන්වහන්සේට විශ්වාසවන්තව සිටිය යුතු බවත් මින් හෙළි වේ. රැළෙන් වෙන් ව ආත්මාර්ථකාමී වීමෙන් ලෝකයේ නපුරාට හසු වන බව අවබෝධ කර ගනිමින් අපි අපගේ කිතුනු ජීවිතය අර්ථවත් කර ගනිමු.

**ක්‍රියාකාරකම්**

1. පහත සඳහන් බයිබල් කොටස් කියවා යහපත් බැටළු එඬේරාණන් හා දුෂ්ට එඬේරුන්ගේ ලක්ෂණ ගොනු කරන්න.

   ගීතාවලිය 23 පරිච්ඡේදය හා එසකියෙල් 34: 18

| යහපත් බැටළු එඬේරා | දුෂ්ට එඬේරුන් |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

2. දේව වචනයේ සඳහන් එඬේර චරිතාංග සිය ජීවිතයෙන් දැක්වූ ඔබ දන්නා මෑත කාලීන නායකයන් දෙදෙනෙකු සඳහන් කරන්න.